රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2019

මගේ අංකය: EST-3/POLIC/04/0039
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.03.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන**
**ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය සංශෝධනය කරමින් නිකුත් කරන ලද 1991.08.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/89(II)හි 1 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. මැතිවරණයක්/ ඡන්ද විමසීමක් සඳහා ඉදිරිපත් වන දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීමට 2019.01.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියට පහත පරිදි 2:3:2:1 නව උප වගන්තිය ඇතුළත් කර සංශෝධනය කෙරේ.

"2:3:2:1 එහෙත්, වසරක් අවසන් වීමට ආසන්නයේ දී නාම යෝජනා කැඳවා එළඹෙන වර්ෂයේ දී මැතිවරණය/ඡන්ද විමසීම පවත්වන අවස්ථාවක දී, පෙර වර්ෂයේ සාමාන්‍ය නිවාඩුවලින් ආවරණය නොවන මැතිවරණය/ඡන්ද විමසීම පැවැත්වෙන වර්ෂයේ යම් කාල පරිච්ඡේදයක් වේ නම් එම කාලය, මැතිවරණය/ඡන්ද විමසීම පැවැත්වෙන වසරේ ඔවුන්ට හිමි අනියම් නිවාඩුවලින් ආවරණය කර ගත හැක.

04. මෙම විධිවිධාන 2019.01.14 දින සිට ඉදිරියට පවත්වනු ලබන මැතිවරණ/ඡන්ද විමසීම් සඳහා බලාත්මක වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය